# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

අංක 2408/15 - 2024 නොවැම්බර් මස 01 වැනි සිකුරාදා - 2024.11.01

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡේදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනත**

2 වැනි වගන්තිය යටතේ නියමය

2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 2 වැනි වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල්, ආර්ථික සංවර්ධන, ප්‍රතිපත්ති සම්පාදන, සැලසුම් සහ සංචාරක අමාත්‍ය අනුර කුමාර දිසානායක වන මම, 2023 නොවැම්බර් මස 01 දිනැති අංක 2356/20 දරන *ගැසට්* නිවේදනයේ සඳහන් වසරක් වූ වලංගු කාලය 2024 නොවැම්බර් මස 01 දිනයෙන් අවසන් වීම මත, මෙහි පහත උපලේඛනයේ I වන තීරයේ නිශ්චිතව දක්වා ඇති වෙළඳ භාණ්ඩ සම්බන්ධයෙන්, එම උපලේඛනයේ II වන තීරයේ අනුරූප සටහන්වල නිශ්චිතව දක්වා ඇති අනුප්‍රමාණ මත මෙතෙක් පැවති විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද, 2024 නොවැම්බර් මස 02 වැනි දින සිට 2024 දෙසැම්බර් මස 31 වැනි දින දක්වා වූ කාල සීමාවක් සඳහා පවත්වාගෙන යාමට මෙයින් නියම කරමි.

**උපලේඛනය**

| *I වන තීරය* | | | | *II වන තීරය* |
|---|---|---|---|---|
| *වෙළඳ භාණ්ඩය* | | | | *විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද* |
| | *සං.ව. ශීර්ෂය* | *සං.ව. සංකේතය* | *විස්තරය* | |
| 01 | 17.01 | | ඝන තත්වයේ ඇති උක් හෝ බීට් සීනි සහ රසායනිකව පවිත්‍ර සුක්‍රෝස් | |
| | | | අනෙකුත්: | |
| | | 1701.91 | එකතු කරන ලද රසකාරක හෝ වර්ණක අඩංගු: | |
| | | 1701.91.10 | පොලරිමීටරයේ 99.7° ට වැඩි හෝ සමාන සංඛ්‍යාත සහිත | කි. ග්‍රෑමයට රු. 50 |
| | | 1701.91.20 | පොලරිමීටරයේ 99.5° ට වැඩි හෝ සමාන සහ 99.7° ට අඩු සංඛ්‍යාත සහිත | කි. ග්‍රෑමයට රු. 50 |
| | | 1701.99 | අනෙකුත්: | |
| | | 1701.99.10 | පොලරිමීටරයේ 99.7° ට වැඩි හෝ සමාන සංඛ්‍යාත සහිත උක් සීනි | කි. ග්‍රෑමයට රු. 50 |
| | | 1701.99.20 | පොලරිමීටරයේ 99.5° ට වැඩි හෝ සමාන සහ 99.7° ට අඩු සංඛ්‍යාත සහිත උක් සීනි | කි. ග්‍රෑමයට රු. 50 |
| | | 1701.99.30 | පොලරිමීටරයේ 99.7° ට වැඩි හෝ සමාන සංඛ්‍යාත සහිත බීට් සීනි | කි. ග්‍රෑමයට රු. 50 |
| | | 1701.99.40 | පොලරිමීටරයේ 99.5° ට වැඩි හෝ සමාන සහ 99.7° ට අඩු සංඛ්‍යාත සහිත බීට් සීනි | කි. ග්‍රෑමයට රු. 50 |
| | | 1701.99.90 | අනෙකුත්: | කි. ග්‍රෑමයට රු. 50 |


1A - PG 6911 — 429 (2024/11)

*මෙම අති විශේෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

මෙම නියමය, 2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 2 වැනි වගන්තියේ (3) වැනි උප වගන්තියේ විධිවිධානවලට යටත්ව, වලංගුව පැවතිය යුතුය.

**අනුර කුමාර දිසානායක,**
මුදල්, ආර්ථික සංවර්ධන, ප්‍රතිපත්ති සම්පාදන,
සැලසුම් සහ සංචාරක අමාත්‍ය.

2024 නොවැම්බර් මස 01 වැනි දින,
කොළඹ 01,
මුදල්, ආර්ථික සංවර්ධන, ප්‍රතිපත්ති සම්පාදන, සැලසුම් සහ සංචාරක අමාත්‍යාංශයේ දී ය.

EOG 11 - 0015

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.